**චීන සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කෙරෙන ප්‍රමුඛතා මාර්ග 3 (අදියර II) ව්‍යාපෘතිය - 2017**

---

චීන සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කෙරෙන ප්‍රමුඛතා මාර්ග 3 (අදියර II) ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සහ චීන සංවර්ධන බැංකු සංස්ථාව අතර 2014 නොවැම්බර් 24 දින එළඹි අංක 4510201401100000587 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

---

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුම අනුව, උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිත ආයතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, තීරණාත්මක ප්‍රවේශතාවක් සපයන ජාතික හා ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය හා පුනරුත්ථාපනය කිරීම සහ ප්‍රවාහන යටිතල පහසුකම් හා සේවාවන්හි ගුණාත්මකභාවය තීරණය කරනු ලබන වැඩිදියුණු කළ ප්‍රවේශයන්ගෙන් ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට විවිධ සමාජ හා ආර්ථික ප්‍රතිලාභ සැලසීමයි.ණය පහසුකම් ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 15,594.14 කට සමාන එ.ජ.ඩො.මිලියන 117.66 ක් වන අතර ඉන් රු.මිලියන 13,253 කට සමාන එ.ජ.ඩො.මිලියන 100 ක් සැපයීම සඳහා චීන සංවර්ධන බැංකු සංස්ථාව එකඟ වී තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ  මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් පිළිබඳ විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණන සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ.මාගේ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කල මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්,මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඈ) ණය යටතේ ආපසු ගැනීම්, ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව,

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව,

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව සහ

(ඌ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහාවූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව,

(ඉ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

--------------------------------------

#### 2.2.1 නීති රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------

ව්‍යාපෘති ක්ෂේත්‍ර කාර්යාල සහ රසායනාගාරවල පැවති වත්කම් පිළිබඳ සමාලෝචිත වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණය මුදල් රෙගුලාසි අංක 756 දැක්වෙන පරිදි එම වත්කම්වල පැවැත්ම තහවුරු කරගැනීමට හැකිවන පරිදි සිදුකර නොතිබුණි.

## 3. මූල්‍ය සහ භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුල සහ 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | 2017 දෙසැම්බර් 31 දිනට |
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ණය සැපයුම් නියෝජිතායතනය | 100.00 | 13,253.00 | 5,900 | 4,917.09 | 7,111.06 |
| ශ්‍රී ලංකා රජය | 17.66 | 2,341.14 | 1,300 | 1,074.00 | 1,445.30 |
| | 117.66 | 15,594.14 | 7,200 | 5,991.09 | 8,556.36 |

### 3.2 භෞතික ප්‍රගතිය

ලැබුණු තොරතුරුවලට අනුව, මෙම ව්‍යාපෘතියේ කාලසීමාව තුල කි.මී.128.85 ක් වන ජාතික මාර්ග 20 ක් පුනරුත්ථාපනය කිරීමට සැලසුම් කර තිබුණි.කෙසේවෙතත්, 2017 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය එදිනට ළඟාකරගැනීමට නියමිතව පැවති සියයට 80.60 ක අපේක්ෂිත ඉලක්කයට එරෙහිව සියයට 47.10 සිට සියයට 77 ක පරාසයකින් ළඟාකරගෙන තිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(1) ඡේදයට පටහැනිව ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුවන්ට අත්තිකාරම් ගණනය කිරීම සඳහා ප්‍රමාණපත්‍ර තුල අසම්භාව්‍ය වටිනාකම් සහ හදිසි අවශ්‍යතා සඳහා කරන ලද වෙන්කිරීම් සැලකිල්ලට ගෙන තිබුණු බවට නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 757 ක් කොන්ත්‍රාත්කරුවන්ට වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) මධ්‍යම පළාතේ මැදවල - හැදෙණිය මාර්ගය සහ පුස්සැල්ලගම - උල්පත මාර්ගය පුනරුත්ථාපන වැඩ මුල් වැඩ විෂයපථය තුල අදාල මාර්ග පුනරුත්ථාපනය කිරීමේ වැඩ වල ඇතුළත්ව නොතිබුණද ක්‍රියාත්මක කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට විචලතා නියෝග යටතේ පිළිවෙලින් රු.මිලියන 295 ක් සහ රු.මිලියන 172.2 ක මුදලක් වියදම් කර තිබුණි. තවද, ඉහත සඳහන් කල වැඩ විෂයපථයේ වෙනස්වීම් සඳහා අදාල පාර්ශවයන්ගෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) ව්‍යාපෘතියේ මුල් වැඩ සැලසුම් තුල ඇතුළත්ව තිබූ රු.මිලියන 245 ක ඇස්තමේන්තුගත පිරිවැයකට ක්‍රියාත්මක කිරීමට නියමිතව පැවති මධ්‍යම පළාතේ මහනුවර රජපිහිල්ල මාවතේ කි.මී.1.75 ක පුනරුත්ථාපනය කිරීමේ වැඩ පසුව අත්හිටුවා තිබුණු අතර ඒ වෙනුවට රු.මිලියන 245 ක පිරිවැයකට මධ්‍යම පළාතේ මහනුවර ඒ.එස්.බී. හමීඩ් මාවතේ කි.මී. 1 ක් පුනරුත්ථාපනය කිරීමේ වැඩ සිදුකර තිබුණි.

**(ඈ)** යටියන්තොට යාබද නගරයට සම්බන්ධ කිරීමෙන් තොරව මාර්ගයේ ඉදිකිරීම් වැඩ නාගස්වැල්ල පාලම දක්වා පමණක් නිමකර ඇති නිසා කි.මී.11 ක් වූ නාවලපිටියේ සිට නාගස්වැල්ල දක්වා අළුතින් ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ගය භාවිතාකරන්නන්ට ආයෝජනයේ උපරිම ප්‍රතිලාභ නෙලාගැනීමට නොහැකිවී ඇති බවට නිරීක්ෂණය විය. මාර්ගයේ ප්‍රතිසංස්කරණ වැඩ සීමාකිරීම සඳහා හේතුවූ කරුණු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

**3.4 මතභේදාත්මක ස්වභාවයේ කරුණු**

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** ප්‍රදේශය තුල අනෙකුත් අරමුදල් දායක ව්‍යාපෘති විසින් සිදුකරන ලද මාර්ග පුනරුත්ථාපන වැඩ සඳහා යොදා ගන්නා ලද රේටයන් සමඟ සංසන්දනය කරන විට ව්‍යාපෘතිය යටතේ මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා ප්‍රමාණපත්‍ර තුල ඇතුළත් කර තිබූ රේටයන් ඉහළ අගයක පැවතුණ බවට නිරීක්ෂණය විය. මධ්‍යම පළාත තුළ මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා ප්‍රමාණපත්‍ර තුල ගස් කපා ඉවත් කිරීම සඳහා යොදා තිබූ රේටය ඒකකයට රු.13,500 සිට රු.40,000 දක්වා පැවතුණි. එහෙත්, අනෙකුත් අරමුදල් දායක ව්‍යාපෘතියක් විසින් සිදුකරන ලද මධ්‍යම පළාතේ බදුල්ල - වෙන්කලාඩි මාර්ගයේ සමාන පුනරුත්ථපන වැඩ සඳහා ඒකකයට රු.5,660 සිට රු.15,470 ක පරාසයකින් යුත් රේටයන් භාවිත කර තිබුණි. තවද, රු.592,780 ක මුදලක් මාර්ග ආරක්ෂාව පාලනය හා කළමණාකරණය කිරීමේ අරමුණින් සහ මාර්ගයේ තදබදය තාවකාලිකව පාලනය කිරීම යනාදිය සම්බන්ධයෙන් වෙන් කර තිබුණි. එහෙත්, බදුල්ල - වෙන්කලාඩි මාර්ග කොටසේ සමාන වැඩ සඳහා රු.207,297 ක් පමණක් වෙන්කර තිබුණි.

**(ආ)** 2018 අප්‍රේල් 04 දින විගණන නිළධාරීන් විසින් මැදවල - කටුගස්තොට මාර්ගයේ සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී කි.මී.6+950 දී ලබගන්නා ලද මූලික සාම්පලය (Core sample)මි.මී.50 සම්මත ඝනත්වයෙන් බැහැරව මි.මී.37.5 ක සාමාන්‍ය ඝනත්වයක පැවතුණි. එබැවින් වැඩවල ගුණාත්මකභාවය සහතික කිරීමේ පාලනයන් සහ මාර්ගයේ පුනරුත්ථාපනය කරන ලද කොටස්වල මාර්ග යෝග්‍යතාවය විගණනයේදී සැකසහිතව පැවතුණි.

**(ඇ)** මාර්ග සංවර්ධන අධිකාරිය 2017 ජූලි මස සිට රු.65,000 ක මාසික පාරිශ්‍රමයකට ව්‍යාපෘතියේ සමාජ හා පාරිසරික අනුකූලතාවය සහ ඉඩම් අත්පත්කරගැනීමේ වැඩකටයුතු සඳහා උපදේශකවරුන් තිදෙනෙක් පත්කර තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුලදී ව්‍යාපෘතිය විසින් ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු සිදුකර නොතිබුණි.

**(ඈ)** කොන්ත්‍රාත් ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසි 4.2 වගන්තියට අනුව, කාර්යසාධන බැඳුම්කරවල පිරිවැය කොන්ත්‍රාත්කරු විසින් සිය වියදමින් දරා ගත යුතුය. කෙසේවෙතත්, ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය තුලදී ජාතික මාර්ග 20 ක් පුනරුත්ථාපනය කිරීමේ වැඩවල නිරතවූ කොන්ත්‍රාත්කරු සඳහා කාර්යසාධන බැඳුම්කර පිරිවැය වශයෙන් ණය මුදල්වලින් රු.මිලියන 6.98 ක මුදලක් වැයකර තිබුණි.